# බුදුසමය ස්ථාපනය සඳහා ටිබෙට් රජවරුන්ගේ දායකත්වය

අම්පාරේ ආනන්ද හිමි[1]

**Abstract**

Tibet is an isolated mountainous state. The Tibetans, a Mongolian tribe, have been living there for an indeterminately long time. The Tibetans, who consisted of many tribes, have a unique set of beliefs which are not having interrelated connection. Known by the common name of Bon, these beliefs are inextricably interconnected with the lives of Tibetans. Buddhism arrived Tibet where there was such a religious environment and became a religion that related to the lives of Tibetans just like the Bon religion. It is believed that Buddhism would have officially introduced to Tibet in the seventh century AD. Although Buddhism officially arrived Tibet as a result of a diplomatic relationship, the establishment of Buddhism in that country was not an easy task. The main reasons for these were that the Bon religion was closely related to the life of Tibetans and there was a strong obstruction of the Bon religious priests. In such a situation, it would not be easy to restore Buddhism in Tibet without the patronage of the Tibetan kings. If it was not so that the Buddhism would not be restored in Tibet. Therefore, the kings have made a huge contribution or patronage to restore the Buddhism in Tibet. Merely because of this reason the names of those kings have been indelibly recorded in the Buddhist history of Tibet.

Keywords: *Bon, Buddhism, Establishment, royal patronage*

---

1 Senior lecturer, Department of Pali and Buddhist Studies, University of Kelaniya, Sri Lanka.

## හැඳින්වීම

ටිබෙටය මධ්‍ය ආසියාතු කලාපයේ හිමාල පර්වත උතුරුදිග සානුවේ තිබෙන හුදකලා රාජ්‍යයකි. එය මුහුදු මට්ටමේ සිට අඩි 14000ක පමණ උසකින් පිහිටි, වර්ග සැතපුම් 470000කින් සමන්විත කඳුකර භූමි භාගයකි(ධම්මදස්සි හිමි, 2009, පි. 13). මොංගෝලීය ජන වර්ගයකට අයත්, ගෝත්‍රික ජන කණ්ඩායමක් වන ටිබෙට්වරුන් ඉතා දීර්ඝ කාලයක සිට ටිබෙටය තුළ ජීවත් වේ. බාහිර ලෝකයෙන් වෙන් ව, හුදකලාව දිවි ගෙවූ ටිබෙට්වරුන්ගේ ආරම්භය නිශ්චිතව ම කිව නොහැකිය. ග්‍රීක ඉතිහාසඥයකු වන හොරොඩෝටස්ගේ ග්‍රන්ථයක් තුළ ටිබෙටය ගැන පළමුවරට සඳහන් වේ. ටිබෙටය හැඳින්වීම සඳහා නම් කිහිපයක් ම භාවිත කර තිබේ. ටිබැට් වැසියන් බොද්යුල් (Bod – Yul) යනුවෙන් ද මාර්කො පෝලෝ ක්‍රි. ව. 13දී තෙබෝක (Tebot) යනුවෙන් ද ටිබෙටය හඳුන්වා තිබේ. ටිබෙට් ග්‍රන්ථ තුළ ථෝද් - බෝද (Thod – Bod) සහ ථෝ පෝ (Tho – Po)  යන නාමයන් දෙකකින් ටිබෙටය හඳුන්වා තිබේ. මෙම ථෝද් බෝද (Thod – Bod) සහ ථෝ පෝ (Tho – Po)  යන නාමයන් දෙක ඒකාබද්ධ වීමෙන් ඕසඉැඑ යන නාමය තැනී ඇතැයි ද සැළකේ (ආනන්ද හිමි සහ කාන්ගහආරච්චි, 1976, පි. 247). චීනය, මොංගෝලියාව, සිකිම් දේශය, ඩාර්ජිලිම, භූතානය, කාශ්මීරය, ලදාඛය යනාදි රාජ්‍යය ටිබෙටයට යාබදව පිහිටා තිබේ (ප්‍රණීත්, 1995, පි.31-32).

බුදුදහම ටිබෙටයට සම්ප්‍රාප්ත වන විට එරට ප්‍රචලිතව පැවතියේ ගස් ගල් ආදී අප්‍රාණික වස්තු වන්‍දනය ද යක්‍ෂ ප්‍රේත ආදී අදෘෂ්‍යමාන ශක්ති විෂයෙහි වන්‍දනාමාන කිරීම ද ඒ විෂයෙහි රුධිර පූජා පැවැත්වීම ද මන්ත්‍ර ජප කිරීම ද පෙරටු කර ගත් 'බොන්' නමින් හැඳින්වූ ඇදහිල්ලකි. විවිධ අදෘශ්‍යමාන ශක්ති විෂයෙහි පුද පූජා පැවැත්වීමෙන් ටිබෙට් වැසියන් දෛනික ජීවිතයට පැමිණෙන අතුරු අන්තරාවන් අවම කර ගැනීම, සතුට සෞභාග්‍ය ලංකර ගැනීම අපේක්‍ෂා කර තිබේ. පුද පූජා කටයුතු මෙහෙය වීම සඳහා පූජක පිරිසක් ද සිටි අතර ඔවුන් බොන්පෝ (Bon po) සහ ෂාන් (gshan=shamans) නමින් හඳුන්වා තිබේ (ධම්මදස්සි හිමි, 2009, පි. 23). දේව නියෝජිතයන් ලෙස පෙනී සිටි ඔවුන් ටිබෙටය තුළ අතිශය බලවත් පිරිසක් වූ අතර පොදු ජනතාවගේ භක්ත්‍යාදරයට ලක්වූ පිරිසක් ද විය. බොන් ආගමේ

අනුගාමිකයන් හඳුන්වා ඇත්තේ බොන් පා (Bon pa) හෝ චචොස් පා (chos pa) නමිනි (ධම්මදස්සි හිමි, 2009, පි. 22). බොන් ඇදහිල්ල එරට වැසියන්ගේ ජීවිතවලට තදින් කිඳා බැස ගත්තක් විය. බුදුසමය හඳුන්වා දෙන්නට යෙදුණේ මෙවැනි ආගමික පසුබිමක් පැවැති පරිසරයකට ය.

**පර්යේෂණ ගැටලුව**

බොන් දහම රාජකීයන්ගේ සිට පොදු ජනතාව දක්වා වූ ටිබෙටයේ සමස්ත ජන සමාජයේ ම ජීවන ක්‍රමය හා තදින් බැඳී පැවතියේය. මෙවන් ආගමික පසුබිමකට බුදුසමය හඳුන්වා දෙනු ලැබූහ. බුදුසමය නිල වශයෙන් ටිබෙටයට හඳුන්වා දීම රාජතාන්ත්‍රික සබඳතාවක ප්‍රතිඵලයක් වශයෙන් සිදු වුව ද බොන් දහම හේතුවෙන් එය ටිබෙටය තුළ ස්ථාපිත කිරීම දුෂ්කර කාර්යයක් විය. එසේ වුවත් පැවැති අභියෝග සියල්ල ජය ගනිමින් බුදුසමය බොන් ඇදහිල්ල තරමට ම ටිබෙටය තුළ මුල් බැස ගෙන තිබේ. ඒ සඳහා බලපෑ හේතු සාධක අතර දේශපාලන තන්ත්‍රයේ ක්‍රියාකාරිත්වය කෙබඳු වීද? යන්න පිළිබඳ සොයා බැලීම මෙම අධ්‍යයනයේදී සිදු විය.

**පර්යේෂණ අරමුණු**

අද වන විට බෞද්ධ ලෝකයට මහඟු දායාදයන් එක් කොට ඇති ටිබෙටයේ බුදුසමය ස්ථාපනය සඳහා එරට රජවරුන් සිදු කළ කාර්යභාරය අනාවරණය කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රමුඛ අරමුණ විය. එමෙන් ම ටිබෙට් බෞද්ධ ඉතිහාසය ගොඩ නැගුණු අයුරු අනාවරණය ද මෙම අධ්‍යයනයේ අරමුණකි. ශාස්ත්‍රීය අධ්‍යයනයන් සඳහා උනන්දු වන්නන්ට මෙන් ම විද්‍යාර්ථීන් සඳහා ශාස්ත්‍රීය දායකත්වයක් සැපයීමට ද මෙමගින් හැකි වන්නේ ය.

**පර්යේෂණ සීමා**

ටිබෙටය තුළ බුදුසමය ස්ථාපිත වීම එකවර සිදු වූවක් නොවේ. එමෙන් ම කෙටි කලකින් සිදු වූවක් ද නොවේ. ඒ සඳහා සැලකිය

යුතු තරම් දිගු කලක් ගත වී තිබේ. එමෙන් ම එම කාර්ය සාර්ථක වීම සඳහා බලපෑ හේතු සාධක ගණනාවකි. ඒවා අතරින් ටිබෙට් රජවරුන්ගේ දායකත්වය කෙරෙහි පමණක් මෙහිදී අවධානය යොමු කොට තිබේ. එමෙන් ම ටිබෙටය තුළ බුදුසමය ස්ථාපිත වීම සඳහා එරට රජවරුන් ගණනාවකගේ ම දායකත්වය ලැබී තිබේ. ඔවුන් අතරින් අධ්‍යයනයේ පහසුව සඳහා බුදුසමයේ ස්ථාපනය සඳහා කැපී පෙනෙන කාර්යභාරයක් සිදු කළ රජවරුන් කිහිප දෙනෙකු පමණක් මෙම අධ්‍යයනට තෝරා ගන්නට යෙදුණි. එමෙන් ම ටිබෙටයට බුදුසමය නිල වශයෙන් හඳුන්වා දුන්නේ යැයි සැලකෙන ක්‍රි.ව. හත්වන සියවසෙන් මෙපිට ශාසන ඉතිහාසයේ තොරතුරුවලට පමණක් මෙහිදී අවධානය යොමු කොට තිබේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයනය මෙහි පර්යේෂණ ක්‍රමවේදය විය.

**සාහිත්‍ය විමර්ශනය**

ටිබෙටයේ බෞද්ධ ඉතිහාසය පිළිබඳ තොරතුරු අනාවරණය වී ඇත්තේ ස්වල්ප වශයෙනි. මේ පිළිබඳ සිංහල භාෂාවෙන් තොරතුරු සඳහන් වන මූලාශ්‍රය ද අවම ය. බුදුසමය ටිබෙටය තුළ ස්ථාපනය සඳහා එරට රජවරුන්ගේ දායකත්වය පිළිබඳ අධ්‍යයනය කිරීමේදී මේ ක්ෂේත්‍රය හා සම්බන්ධයෙන් වැදගත් වන තොරතුරු අන්තර්ගත සාහිත්‍ය මූලාශ්‍රය කිහිපයක් හඳුනා ගත හැකි වූ අතර ඒවා මෙම අධ්‍යයනය සඳහා ද උපයෝගී විය.

නායිම්බල ධම්මදස්සි හිමි විසින් රචනා කරන ලද ටිබෙට් බුදුසමය නම් ග්‍රන්ථයෙහි ප්‍රාග් බෞද්ධ ටිබෙටයේ ආගමික පසුබිමේ සිට බුදුසමය එරටට හඳුන්වා දීම සහ බුදුසමය එරටෙහි ස්ථාපිත වීම දක්වා තොරතුරු සංක්ෂිප්තව දක්වා තිබේ. එමෙන් ම භාරතයේ බිහි වූ බෞද්ධ සම්ප්‍රදායන් ටිබෙටය තුළ පැතිරුණු ආකාරය ද ටිබෙට් බෞද්ධ සාහිත්‍ය පිළිබඳව ද මෙම කෘතියෙහි තොරතුරු අන්තර්ගත වේ. මෙම අධ්‍යයනය සඳහා ඒ සමස්ත ග්‍රන්ථය ම උපයෝගී වූ අතර

එහි තුන්වන පරිච්ඡේදය සෘජුව අදාළ විය. මිස්සක කමලසිරි හිමිගේ අප්‍රකට බෞද්ධ ලෝකය නම් කෘතියෙහි බෞද්ධ රාජ්‍යයන් කිහිපයක මෙතෙක් අනාවරණය නොවුණු තොරතුරු අන්තර්ගත වේ. මෙහි අන්තර්ගත ඇතැම් තොරතුරු ලෝක බෞද්ධ සංස්කෘතිය පිළිබඳ මෙතෙක් ලියැවී ඇති කෘතීන්හි අන්තර්ගත නොවේ. එමෙන් ම මෙහි ඇතුළත් බෞද්ධ රාජ්‍යයන් කිහිපයක තොරතුරු මෑතකාලීන තොරතුරු වීම ද විශේෂත්වයකි. මෙම අධ්‍යයනය සඳහා එම කෘතියේ පළමු පරිච්ඡේදය අදාළ විය. වැල්ලවත්තේ ආනන්ද හිමියන් සහ ටී.බී. කාන්ගහආරච්චි විසින් රචනා කරන ලද සංක්ෂිප්ත ලෝක බෞද්ධ සංස්කෘතිය නම් කෘතියෙහි ලෝකයේ රටවල් ගණනාවක බෞද්ධ සංස්කෘතිය පැතිරී ඇති ආකාරය පිළිබඳ ව මෙන් ම බෞද්ධ සංස්කෘතියේ බලපෑමෙන් ඒ ඒ රටවල සංස්කෘතීන්හි ඇති වූ වෙනස්කම් පිළිබඳව ද තොරතුරු අන්තර්ගත වේ. එම ග්‍රන්ථයේ දහතුන් වැනි පරිච්ඡේදයේ අන්තර්ගත තොරතුරු මෙම අධ්‍යයනයට අදාළ විය. බඹරැන්දේ සිරි සීවලී හිමියන් විසින් රචිත බෞද්ධ ලෝකය නම් කෘතියෙහි ලෝකයේ බොහෝ රටවල බෞද්ධ සංස්කෘතිය පැතිරුණු ආකාරය පිළිබඳව මෙන් ම ඒ ඒ රටවල සංස්කෘතිය විෂයෙහි බෞද්ධ සංස්කෘතිය බලපා ඇති ආකාරය විස්තර කෙරේ. එම ග්‍රන්ථයේ දාහත්වන පරිච්ඡේදයේ අන්තර්ගත තොරතුරු මෙම අධ්‍යයනය සඳහා අදාළ විය. කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය මගින් මුද්‍රණය කරන 'සාරදා' සඟරාවේ 8වන කලාපයෙහි ඇතුළත් ''ටිබැටයේ බෞද්ධ ඉතිහාසය'' නම් ලිපිය ද මෙම පර්යේෂණය සඳහා බොහෝ සෙයින් අදාළ විය. P.V. Bapat විසින් රචිත 2500 YEARS OF BUDDHISM නම් කෘතියෙහි බෞද්ධ ඉතිහාසය හා බුදුසමයේ ලෝක ව්‍යාප්තිය පිළිබඳ තොරතුරු අන්තර්ගත ය. මෙම ග්‍රන්ථයේ තුන්වන පරිච්ඡේදයට අයත් 65 පිටුවේ සිට 73 පිටුව දක්වා වූ පිටුවල අන්තර්ගත තොරතුරු මෙම පර්යේෂණය සඳහා අදාළ විය.

**සාකච්ඡාව**

බුදුසමය ටිබෙටයට සම්ප්‍රාප්ත වූයේ කවදාදැයි නිශ්චිත නැත. එසේ වුවත් ක්‍රි.ව. තුන්වන සියවසේ සිට හත්වන සියවස දක්වා වූ සියවස් අතර කාලවලදී බුදුසමය පිළිබඳ පණිවුඩය වරින් වර ටිබෙටයට ලැබෙන්නට ඇතැයි පිළිගත හැකි ය. එසේ වුවත් ක්‍රි.ව. හත්වන

සියවසේදී බුදුසමය ටිබෙටයට නිල වශයෙන් හඳුන්වා දුන්නේ යැයි පිළිගැනේ. ඒ රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවක ප්‍රතිඵලයක් වශයෙනි. එහෙත් ටිබෙටය තුළ බුදුසමය ස්ථාපිත කිරීම පහසු කටයුත්තක් නොවීය. එරට පැවති ආගමික පරිසරය එයට හේතු විය. ටිබෙට් වැසියන්ගේ දෛනික ජීවිතය හා තදින් බැඳී පැවැති බොන් ආගමේ පූජකවරුන්ගෙන් බුදුසමයට එල්ල වූයේ ප්‍රබල විරෝධයකි. ඔවුන් ප්‍රභූන්ගේ ද පොදු ජනතාවගේ ද සහය ලබමින් බුදුසමයට එරෙහිව ප්‍රබල විරෝධතා ව්‍යාපාරයක් ගෙන යනු ලැබූහ. එවැනි තත්ත්වයක් තුළ ටිබෙටයට බුදුසමය හඳුන්වා දීම, එරටෙහි බුදුසමය ස්ථාවර කිරීම පහසු කටයුත්තක් නොවීය. මෙම අභියෝග සාර්ථකව ජය ගනිමින් බුදුසමය ටිබෙටයෙහි ස්ථාපිත කිරීමට හැකි වූයේ එරට රජවරුන්ගෙ න් ලැබුණු නොමඳ අනුග්‍රහය හේතුවෙනි. ඒ සඳහා මැදිහත් වූ සියලු රජවරුන්ගේ ක්‍රියා කලාප අධ්‍යයනයේ පහසුව සඳහා මෙහිදී සඳහන් නොකරන අතර සුවිශේෂී කාර්යභාරයක් සිදු කළ

1. ස්‍රොං - ත්සන් - ගම්පො
2. ඒස්‍රොංග් - දෙත්සාන්
3. රපාචෙන්
4. දල් - බොර් - බසාන්

යන රජවරුන් කිහිප දෙනෙකුගේ ක්‍රියාකලාපයන් පිළිබඳ පමණක් විමසා බැලීමක් සිදු කොට තිබේ. එමෙන් ම බුදුසමය නිල වශයෙන් හඳුන්වා දුන්නේ යැයි සැලකෙන ක්‍රි.ව. හත්වන ශතවර්ෂයෙන් මෙපිට ඉතිහාසයේ සිටි රජවරුන් කිහිප දෙනෙකු හා සම්බන්ධ තොරතුරුවලට පමණක් මෙම අධ්‍යයනය සීමා වේ.

**ස්‍රොං - ත්සන් - ගම්පො රජු**

ක්‍රි.ව. 07 වන ශත වර්ෂය වන විට ටිබෙටයේ රාජ්‍යත්වය උසුලමින් සිටි මෙම රජුගේ පාලන සමයේදී නිල වශයෙන් ටිබෙටයට බුදුසමය සම්ප්‍රාප්ත වූයේ යැයි පිළිගැනේ. ටිබෙටයට බුදුසමය සම්ප්‍රාප්ත වූයේ වෙනත් රටවලට වඩා වෙනස් අයුරකිනි. විවාහ සබඳතාවක් ඒ සඳහා පදනම සැකසීය. ටිබෙටයේ බිහි වූ බලවත් රජ කෙනෙකු වූ ස්‍රොං -

ත්සන් - ගම්පො සිය රාජ්‍යයේ දේශ සීමා ආක්‍රමණය කර සිටි චීන සෙබලුන් පලවා හැර චීනයෙන් සිය රටට කප්පම් ගැනීමට සමත් වූ ප්‍රබල රජෙකි. මධ්‍යම ආසියානු කලාපයේ රාජ්‍ය කෙරෙහි ද අනුහස පෑමට තරම් සමතෙකු විය. මෙම රජු තම දේශපාලනික සබඳතා ශක්තිමත් කර ගැනීමට චීනයෙන් මෙන් ම නේපාලයෙන් ද රාජ කුමාරිකාවන් දෙදෙනෙකු විවාහ කර ගෙන තිබේ. ඒ අනුව චීනයේ ථායි - ත්සුංග් අධිරාජයාගේ දියණියක වන වෙන් - චෙන්ග් කුමරිය ද නේපාලයේ අංසුවර්මන් රජුගේ දූ කුමරියක වූ භෘකුති කුමරිය ද විවාහ කර ගෙන තිබේ. බෞද්ධ උපාසිකාවන් වූ මේ කුමාරිකාවන් දෙදෙනා ටිබෙටයට පැමිණෙන විට අක්ෂෝභ්‍ය, ශාක්‍යමුනි යන බුදුවරුන්ගේ ප්‍රතිමා ද බෞද්ධ පොත්පත් ද සර්වඥ ධාතු ද ටිබෙටයට රැගෙනැවිත් තිබේ. මෙම ගමනේදී බෞද්ධ භික්ෂූන් වහන්සේලා ද ටිබෙටයට වැඩම කර තිබේ. මෙය බැලූ බැල්මට ම දූත මෙහෙවරක් සේ පෙනේ.

රජු මෙම රාජ කුමාරිකාවන් දෙදෙනා රැගෙන ආ බුද්ධ ප්‍රතිමා තැන්පත් කිරීම සඳහා විහාරයක් ඉදි කළ අතර පසු කලෙක ජොඛංග් විහාරය නමින් ප්‍රකට වූයේ එයයි. රාජකීයන් විසින් ගොඩ නගා දුන් ආරාමවල භික්ෂූන් වහන්සේලා වැඩ සිටියහ. රැගෙන ආ බෞද්ධ ධර්ම ග්‍රන්ථ ටිබෙට් බසට පරිවර්තනය කිරීමට අවශ්‍ය වුව ද ඒ සඳහා දියුණු අක්ෂර මාලාවක් නොමැති වීම මෙන් ම උගතුන් ටිබෙටයේ නොසිටීම හේතුවෙන් තම අගමැති ථොන්මි සම්භෝත ඇතුළු දූත පිරිසක් රජු විසින් ඉන්දියාවට යවා තිබේ. ඉන්දියාවට පැමිණි එම දූත පිරිස දකුණු ඉන්දියාවේ එකල ජනප්‍රියව පැවති මහායාන අධ්‍යාපන මධ්‍යස්ථානවල නැවතී සිටිමින් ඉතා කෙටි කලක් තුළදී සංස්කෘත භාෂාව හා සාහිත්‍ය මූලික කරගත් අධ්‍යාපනයක් ලබා පෙරළා ටිබෙටයට පැමිණියේය. අගමැති ථොන්මි සම්භෝත විසින් දේව නාගරී අක්ෂර මාලාවට අනුරූපී ව ටිබෙට් භාෂාවට අක්ෂර මාලාවක් සකස් කළ අතර ඒ සඳහා කාණ්ඩ අටකින් සමන්විත ව්‍යාකරණ ග්‍රන්ථයක් ද සම්පාදනය කරන්නට යෙදුණි. රැගෙන ආ ධර්ම ග්‍රන්ථ සියල්ල පාහේ ටිබෙට් බසට පරිවර්තනය කර තිබේ. මේ හේතුවෙන් ටිබෙට් අධ්‍යාපනයේ මෙන් ම සාහිත්‍යයේ පුරෝගාමියා ලෙස ථොන්මි සම්භෝත සම්භාවනීයත්වයට පත් ව තිබේ.

ස්‍රොං - ත්සන් - ගම්පො රජු බෞද්ධ ඉගැන්වීම් ප්‍රායෝගික ව යොදා

ගනිමින් දස සීලයට අනුරූපී ව නීති මාලාවක් ද සකස් කර තිබේ. සැදැහැවත් බෞද්ධයෙකු ලෙස කටයුතු කළ මෙම රජු 'රමෝචේ' හා 'ජොඛංග්' යන විහාර ද ඉදිකර ඇත. පසුකලෙක ටිබෙටයේ අගනුවර වූ ලාසා නගරය ගොඩ නැගූ මෙම රජු දලයි ලාමාගේ මාලිගය වන පෝතල මාලිගය නිර්මාණය කිරීමේ ආරම්භකයා ද වේ. ටිබෙට් ඉතිහාසය පළමුවරට ලියා තබන්නට කටයුතු කරනු ලැබුවේ ද මෙම රජු විසිනි. ජාතික හා ආගමික වශයෙන් සුවිශාල මෙහෙවරක් කළ මෙම රජු අවලෝකිතේශ්වර බෝසතුන්ගේ අවතාරයක් ලෙස ටිබෙටය තුළ සම්භාවනීයත්වයට පත්ව තිබේ (මංගල, 1997, පි. 35-37). රජුගේ චීන අගමෙහෙසිය 'සුදු තරුව' ලෙසින් ද නේපාල අගමෙහෙසිය 'නිල් තරුව' ලෙසින් ද ටිබෙටයේ ජනප්‍රිය වී තිබේ (සීවලී හිමි, 1973, පි. 343).

## ඒස්‍රොංග් - දෙත් - සාන් රජු

ටිබෙටයේ බුදුසමය ස්ථාපිත වීම හා සම්බන්ධ තොරතුරු අධ්‍යනයේදී ඒ සඳහා සුවිශාල මෙහෙවරක් කළ රජ කෙනෙකු ලෙස ඒස්‍රොංග් - දෙත්සාන් රජු හැඳින්විය හැකිය. ස්‍රොං - ත්සන් - ගම්පො රජු බුදුසමය ටිබෙටය තුළ ස්ථාපිත කිරීමට කටයුතු කරන විට බොන් ආගමික පූජකවරුන්ගෙන් නැගුණු බලවත් විරෝධතාව හේතුවෙන් එය පසුබෑමට ලක් විය. එබඳු වාතාවරණයක් තුළ ටිබෙටයෙහි බුදුසමය ස්ථාපිත කිරීම සඳහා ඒස්‍රොංග් - දෙත්සාන් රජුගෙන් සිදු වූ මෙහෙවර සම්භාවනීය වේ. අසල්වැසි රාජ්‍යය දක්වා තම අනුහස විදහා දැක්වූ ටිබෙටයේ තවත් ශ්‍රේෂ්ඨ නරපතියෙකු වශයෙන් ද ප්‍රකට මෙම රජු භක්තිමත් බෞද්ධයෙකු ද වේ. බුදුසමය ටිබෙටයේ ස්ථාපිත කිරීම සඳහා ඉන්දියාවේ නාලන්දා විශ්වවිද්‍යාලයේ සිටි කීර්තිමත් පඬිරුවනක් වූ ශාන්තරක්ෂිත තෙරුන්ට ටිබෙටයේ ධර්ම ප්‍රචාරය සඳහා වඩින ලෙසට රජු ආරාධනා කළේය. රජුගේ ආරාධනය පිළිගත් ශාන්තරක්ෂිත තෙරුන් ටිබෙටයට වැඩම කර ධර්ම ප්‍රචාරක කටයුතුවල නිරත වන්නට යෙදුණි. එකල ටිබෙටය පුරා හමාගිය කුණාටු, සුළි සුළං, රෝග පීඩාවන්ගෙන් ප්‍රයෝජන ගත් බොන් ආගමික පූජකවරුන් නව දහමක් පිළිගත් නිසා බොන් ආගමික දෙවිවරුන් කෝප වීමෙන් මෙම විපත රටට සිදු වූ බව හුවා දක්වමින් රාජ සභාවේ සිටි පිරිසකගේ ද

සහය ලබමින් විශාල කැරැල්ලක් රට තුළ ඇති කරනු ලැබූහ. ආරක්ෂාව පිණිස තාවකාලික ව ශාන්තරක්ෂිත තෙරුන් නේපාලයට පිටත්කර හැරි රජු එම කැරැල්ල මැඩ පවත්වීමෙන් අනතුරු ව යළිත් වරක් ශාන්තාරක්ෂිත තෙරුන් ටිබෙටයට වැඩම කරවා ගෙන තිබේ.

දෙවනවර ටිබෙටයට වැඩම කළ ශාන්තරක්ෂිත තෙරුන් බොන්පාවරුන් මැඩලා ධර්ම ප්‍රචාරක කටයුතු සාර්ථකව ඉදිරියට ගෙන යාම සඳහා යන්ත්‍ර මන්ත්‍ර ආදී ගුප්ත විද්‍යාවන්හි මහත් දැනුම ඇත්තකු මෙන් ම අධි මානුෂික බලයක් ඇත්තකු ලෙස මහත් ප්‍රසිද්ධියක් ඉසිලූ පද්මසම්භව තෙරුන් ටිබෙටයට වැඩම කර ගැනීමේ ඇති වැදගත්කම රජුට පෙන්වා දී තිබේ. උන්වහන්සේගේ මග පෙන්වීම අනුව රජු විසින් ටිබෙටයේ ධර්ම ප්‍රචාරක කටයුතුවල නියැලීම සඳහා වැඩම කරන මෙන් පද්මසම්භව තෙරුන්ගෙන් ඉල්ලා ඇත. නාලන්දා විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලැබූවකු වන කාශ්මීරයටත් ඇෆ්ගනිස්ථානයටත් අතර උදයන ප්‍රදේශයේ උපත ලැබූ භූතවිද්‍යා පිළිබඳ හසල දැනුමක් ඇත්තෙකු ලෙස ප්‍රකට වූ පද්මසම්භව තෙරුන් රජුගේ ආරාධනය පිළිගෙන තමන් ඉදිරියේ ඇති අභියෝග මනාව හඳුනාගෙන එයට මනා සූදානමක් ඇතිව ටිබෙටයට වැඩම කර තිබේ.

තන්ත්‍රයානික පඬිවරයෙකු වූ උන්වහන්සේ යක්ෂ, භූත, රාක්ෂයන්ට අතිශය බියක් දැක්වූ ටිබෙට් ජනතාවට ඒවා දිනිය හැකි බලවේග බව ඒත්තු ගන්වන්නට විය. පුද පූජා වන්දනාමානාදිය තාන්ත්‍රික සංකේතානුසාරයෙන් අරුත් ගැන්වූ උන්වහන්සේ බොන් ආගමික දෙවි දේවතාවුන්ට තාන්ත්‍රික මුහුණුවරක් එක් කරමින් තාන්ත්‍රික දෙවි දේවතාවුන් බවට පරිවර්තනය කළහ. බොන් ආගමික විශ්වාසයන්ට නව අරුත් ගන්වමින් භූතවිද්‍යාව යනු අභ්‍යන්තර පාරිශුද්ධත්වය ලැබිය හැකි මාර්ගයක් බව පෙන්වා දුන් උන්වහන්සේ උපාය මාර්ගික ව පොදු ජන හදවත් වෙත සමීප වීමට සමත් විය. තාන්ත්‍රික ඉගැන්වීම් දේශීය මුහුණුවරකින් ජන හදවත් වලට සමීප කළ උන්වහන්සේ ජනතා ගෞරවය දිනා ගත්හ. බෞද්ධාගමික ඉගැන්වීම් දේශීයත්වයට ගැලපෙන අයුරින් වෙනස් කළ උන්වහන්සේ බොන් ආගමික පූජකවරුන් කලු හිස් වැසුම් පැළඳ සිටි හෙයින් භික්ෂූන් වහන්සේලාට රතු හිස් වැස්මක් ද හඳුන්වා දෙමින් බාහිර පෙනුම ද ඒ අනුව සකස්

කළහ. පසු කලකදී ටිබෙටයේ රතු හිස් වැසුම් නිකාය ලෙස මෙම භික්ෂු පිරිස ප්‍රකට වී තිබේ. බොන්පාවරුන්ගේ සියලු විරෝධතා හා බාධක උපායශීලී ව ජයග්‍රහණය කළ උන්වහන්සේ ඉන් අනතුරු ව ශාන්තරක්ෂිත තෙරුන් හා එක්ව ටිබෙටය පුරා ධර්ම ප්‍රචාරයේ නිරත වූහ.

ඒස්‍රොං - දෙත්සාන් රජු ටිබෙටයේ පළමු බෞද්ධ ආරාම සංකීර්ණය වන සම්යේ ආරාම සංකීර්ණය ගොඩනගා ඇති අතර එහි අධිපතිත්වය ශාන්තරක්ෂිත තෙරුන්ට පවරා තිබේ. සියලු ආරාම අංගයන්ගෙන් සමන්විත ව ගොඩ නගා ඇති මෙහි සුවිශාල පොත්ගුලක් ද ඉදිකර තිබේ. ශාන්තරක්ෂිත තෙරුන් මෙම ආරාමය තුළ වැඩ සිටිමින් ධර්ම ග්‍රන්ථ පරිවර්තනය කරමින් ද ධර්ම ග්‍රන්ථ රචනා කරමින් ද නව සාහිත්‍ය යුගයකට මඟ පාදන්නට යෙදුණි. උදා වූ නව සාහිත්‍ය පුනර්ජීවන යුගයේදී චීනයෙන් හා ඉන්දියාවෙන් වැඩම කළ උගත් භික්ෂූන් වහන්සේලා ධර්ම ග්‍රන්ථ පරිවර්තනය කිරීමේ කාර්යයයේ නිරත විය. ශාන්තරක්ෂිත තෙරුන් හා පද්මසම්භව තෙරුන්ගෙන් පසුව ද උන්වහන්සේලා වැඩ සිටි සමයේදී අරඹන ලද බෞද්ධාගමික මෙහෙවර නොනැවතී ඉදිරියට ගියේය.

අඛණ්ඩ ව ටිබෙටයට පැමිණි චීන, ඉන්දියානු බෞද්ධ උගතුන් බෞද්ධ ධර්ම ග්‍රන්ථ ටිබෙට් බසට පරිවර්තනය කිරීම ද ධර්ම ග්‍රන්ථ රචනා කිරීම ද සිදු කරන්නට විය. චීනයෙන් වැඩම කරන්නට යෙදුණු මහායානික ඇතැම් භික්ෂූන් වහන්සේලා ටිබෙටයේ වැඩෙමින් තිබුණු ලාමාවාදයට විරෝධය පල කරන්නට යෙදුණි. මෙම විරෝධතා බලවත් වීම හේතුවෙන් උද්ගත වූ විවාදකාරී තත්ත්වය සංසිඳුවීම සඳහා ශාන්තරක්ෂිත තෙරුන්ගේ ශිෂ්‍ය කමලශීල තෙරුන් වැඩම කර ගැනීමට ඒස්‍රොංග් - දෙත්සාන් රජුට සිදු විය. රජුගේ ආරාධනයෙන් ටිබෙටයට වැඩම කළ උන්වහන්සේ චීන භික්ෂූන්ගේ විරෝධතා මැඩලීමට කටයුතු කර තිබේ. විරෝධතා දක්වූ චීන ජාතික මහායාන භික්ෂුවක් වන 'හ්වාෂංග්' හිමියන් හා 'කමලශීල' හිමියන් අතර මහා විවාදයක් රජු ඉදිරියේ පැවැත් වූ අතර කමලශීල තෙරුන් එය ජයග්‍රහණය කරනු ලැබූහ. මෙතැන් පටන් ටිබෙටය තුළ පැවතිය යුත්තේ ඉන්දියානු බුදුසමය පමණක් බව ඒ ස්‍රොංග් - දෙත්සාන් රජු

නිවේදනය කිරීමත් සමග විරෝධතා යටපත් විය. හ්වාෂංග් හිමියන් සිය රට බලා වැඩම කළ අතර උන්වහන්සේගේ අනුගාමිකයන් විසින් කමලශීල හිමියන් ඝාතනය කරනු ලැබූහ (මංගල, 1997, පි. 37-40). ටිබෙටය පුරා අතිශය ගෞරවාදරයට පත් වූ උන්වහන්සේගේ ඝාතනය ටිබෙටය කම්පා කරන්නක් විය.

ඉන්දීය පඬිවරුන්ගේ ඥාණ සම්භාරය සිය රටට ලබා ගනිමින් බෞද්ධ ධර්ම ග්‍රන්ථ ටිබෙට් බසට පරිවර්තනයට හා නව ග්‍රන්ථ සම්පාදනට අවශ්‍ය පහසුකම් සැලසූ ඒස්‍රොංග් - දෙත්සාන් රජු නව බෞද්ධ පුනර්ජීවනයක් සිය රට තුළ ඇති කරන්නට සමත් විය. උගතුන්ට ප්‍රියකළ, ඔවුන්ගේ සේවය සිය රටට ලබා ගනිමින් සිය ජනතාව දනුමෙන් පෝෂණය කරන්නට යෙදුණු මෙම රජු මංජු ශ්‍රී බෝසතුන්ගේ අවතාරයක් ලෙස මහජන ප්‍රසාදයට ලක් ව තිබේ. ඉන් පසු බලයට පැමිණි මෙම රජුගේ පුත් කුමරු වන මූ - මේ - සාන් - පො කුමරු පියාගේ මෙහෙවර ඉදිරියට ගෙන යමින් ටිබෙට් බුදුසමයේ සමෘද්ධිය පිණිස කටයුතු කර තිබේ. බෞද්ධ සංස්කෘත ග්‍රන්ථ රාශියක් මෙම රජ සමයේදී ද ටිබෙට් බසට පරිවර්තනය වී ඇත (ආනන්ද හිමි සහ කාන්ගහආරච්චි, 1967, පි. 250).

**රපාචෙන් රජු**

ටිබෙට් බෞද්ධ ඉතිහාසය හැදෑරීමේදී වැදගත් වන තවත් රජ කෙනෙකු ලෙස රපාචෙන් රජු හැඳින්විය හැකි ය. බෞද්ධ සංස්කෘතිකාංග ටිබෙටය තුළ ප්‍රචලිත කරලීමට කටයුතු කළ රජෙකු ලෙසින් මෙම රජු වඩාත් ප්‍රකට ය. සිය බාල සොහොයුරු ප්‍රව්‍රජ්‍යා භූමියට පත් කළ රජු උන්වහන්සේට ආරාමයක් ඉදිකර දී සමස්ත භික්ෂූන් වහන්සේලාගේ අධිපතිත්වයට ද උන්වහන්සේ පත් කොට තිබේ. ටිබෙට් බුදුසසුනේ සංවර්ධනය පිණිස නොමඳ අනුග්‍රහයක් ලබාදුන් රජු පුස්තකාල ඉදි කරමින් බෞද්ධ අධ්‍යාපනය ද සංවර්ධනය කරන්නට යෙදුණේය. බෞද්ධ මූර්ති කලාව මෙන් ම චිත්‍ර කලාව ද ටිබෙටයේ ප්‍රචලිත කිරීමට රජුගෙන් මහඟු දායකත්වයක් ලැබුණි. රට රටවල බෞද්ධ උගතුන් සිය රටට ගෙන්වා ගත් රජු අන්තර් ජාතික බෞද්ධ සම්මේලනයක් ද ටිබෙටයේ පවත්වා ඒ තුළින් ටිබෙට් බුදුසසුනේ මෙන් ම බෞද්ධ

සාහිත්‍යයේ දියුණුව ඇතිකර ලීමට ක්‍රියා කොට තිබේ. ඔහු තම දිගු කෙස්වැටිය භික්ෂූන්ගේ පරිභෝජනය සඳහා පාපිස්නක් ලෙස තබන්නට තරම් භක්තිමත් වූ නරපතියෙකි. ටිබෙට් බුදුසමයේ දියුණුව සඳහා රජු කළ මෙහෙය නොරිස්සූ ඔහුගේ වැඩිමහල් සොහොයුරු ග්ලන්ධර්ම කුමරු රජු මරා රාජ්‍යත්වයට පත් ව තිබේ (මංගල, 1997, පි. 41).

මිථ්‍යාදෘෂ්ටික රජෙකු වූ මෙම රජුගේ පාලන සමය ටිබෙට් බුදුසමයේ අඳුරුතම යුගය ලෙස සටහන් වේ. බෞද්ධ විරෝධියකු වූ මොහු බලයට පත්වීමත් සමග බෞද්ධ වෙහෙර විහාර විනාශ කරමින්, බෞද්ධ පොත් පත් ගිනිලමින්, පූජනීය වස්තු කඩා බිඳ දමමින් කටයුතු කර තිබේ. රටින් පිටුවහල් කිරීමේ ආඥාව මත බොහෝ භික්ෂූන් සිවුරු හරවා ඇති අතර එයින් බේරී භික්ෂු පිරිසක් අසල්වැසි බෞද්ධ රාජ්‍ය වෙත පිහිට පතා පලා ගොස් තිබේ. අවාසනාවකට මෙන් චීනයේ ද මෙකල මහා බෞද්ධ සංහාරයක් ක්‍රියාත්මක වීම හේතුවෙන් ටිබෙටයේ බෞද්ධ බලය අන්තයට ම පිරිහී බෞද්ධ භික්ෂූන් ද ගිහි ජනතාව ද අන්ත අසරණ තත්ත්වයට පත්වීම වළක්වා ලීමට කිසිදු බලවේගයක් ඉදිරිපත් වී නොමැත. ක්‍රි. ව. 900දී භික්ෂුවක් විසින් විදින ලද ඊතල පහරකින් රජු මරණයට පත්වීමත් සමඟ ටිබෙටයෙන් බුදුසමය තුරන් කර දැමීමට රජු ගෙන ගිය වැඩ පිළිවෙළ නතර විය. විදෙස්ගත ව සිට සිය රටට වැඩම කළ භික්ෂූන් ද බෞද්ධ මහ ජනතාව ද යළි එක් ව බුදුසසුන නඟා සිටුවීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන තිබේ.

## දල් බොර් බසාන් රජු

ග්ලන්ධර්ම රජුගේ අඳුරු පාලන සමය නිමා වීමත් සමග රාජ්‍යත්වයට පැමිණි දල් - බොර් - බසාන් රජු බිඳ වැටුණු බෞද්ධ බලය නඟා සිටුවීම සඳහා අවශ්‍ය අනුග්‍රහය ලබා දුන්නේය. රජු විසින් දඹදිව වික්‍රමශිලා විශ්වවිද්‍යාලයේ වැඩ සිටි කීර්තිමත් පඬිවරයෙකු වූ අතීස දීපංකර හිමි හෙවත් දීපංකර ශ්‍රී ඥාන හිමියන් 1038දී සිය රටට වැඩම කරවා ගනු ලැබුවේ ද ඒ සඳහා ය. ටිබෙටයට වැඩම කළ උන්වහන්සේ බුදුසසුනේ පුනර්ජීවනය සඳහා සියලු ක්‍රියාමාර්ග ගන්නට යෙදුණහ. ටිබෙටයේ එතෙක් පැවති සියලු ගුරුකුලවල ඉගැන්වීම් සම්පිණ්ඩනය

කර ජනතාවට දේශනා කරමින් ටිබෙටයේ සමස්ත ජනතාව ම එකම මඟක් ඔස්සේ නිවැරදි දර්ශනයක් කරා මෙහෙය වූ උන්වහන්සේ ජීවිතයේ සන්ධ්‍යා භාගයේදී ටිබෙටයට වැඩම කොට පුරා වසර 10ක් එහි වැඩ සිටිමින් වසර 70ක් පමණ ආයු වළඳා මෙලොවින් සමුගෙන තිබේ. උන්වහන්සේ ටිබෙටයේ ගතකළ වසර 10 මුළුල්ලේ ධර්ම ප්‍රචාරය කරමින්, කාලචක්‍ර යානයට අටුවා ලියමින් සුවිශාල මෙහෙවරක් සිදු කොට තිබේ.

ටිබෙටයේ ධර්ම ප්‍රචාරය සඳහා ඉන්දියාවෙන් වැඩම කළ අවසන් ධර්ම දූතයන් වහන්සේ ලෙස ඉතිහාසයට එක් වන්නේ ද උන්වහන්සේ ය. ඉන්දියාවේ තන්ත්‍රයානය බලවත් ව පැවති මෙම යුගයේදී ඉන්දියාව හා ටිබෙටය අතර ඇති වූ මෙම බෞද්ධ සබඳතාව හේතුවෙන් ටිබෙටයේ ද තන්ත්‍රයානය මුල්බැස ගත්තේය. බුදුසමය දේශීය ජන ඇදහිල්ලක් ලෙසින් හෙවත් ලාමාවාදයක් දක්වා සංවර්ධනය වූයේ ද මේ යුගයේදීය (ආනන්ද හිමි සහ කාන්ගහආරච්චි, 1967, පි. 250-251). එතැන් පටන් ලාමාවාදය සංශෝධනය වෙමින් ප්‍රතිසංශෝධනය වෙමින් විවිධ නිකායවලට බෙදී ගිය අයුරු දක්නට ලැබේ. නූතන ටිබෙටයේ දක්නට ලැබෙනුයේ මෙකල සංවර්ධනයට පත් ලාමාවාදයේ උච්චතම සංවර්ධනයයි.

ඉන් පසු උදා වූ සමයේදී ටිබැටයේ රාජ්‍ය බලය පරිහානියට පත් විය. දේශපාලනික අවුල් වියවුල් සහිත සමයක් දිගින් දිගට ම පැවතියේය. මෙම දේශපාලනික අස්ථාවරත්වය හමුවේ මොංගෝලීය අධිරාජයකු වන 'ජෙංගිස් ඛාන්' විසින් 1206දී ටිබැටය මොංගෝලීය පාලනයට නතුකර ගත්තේය. පසු කලෙක මොංගෝලීය පාලකයන් ටිබෙටය ලාමාවරුන්ට බාර කරන්නට යෙදුණි.

**සමාලෝචනය**

රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවක ප්‍රතිඵලයක් වශයෙන් බුදුසමය ටිබෙටයට නිල වශයෙන් පැමිණියේය. දේශීය ආගමික පරිසරයෙන් පැන නැගුණු ප්‍රබල විරෝධතා හේතුවෙන් බුදුසමය ටිබෙටයෙහි ස්ථාපිත වීම දුෂ්කර විය. මෙබඳු තත්ත්වයකදී බුදුසමය ටිබෙටය තුළ ස්ථාපිත වන්නට,

නිදහසේ වැඩෙන්නට හැකි වූයේ එරට රජවරුන්ගේ ප්‍රශංසනීය කාර්යභාරය හේතුවෙනි. එසේ නොවන්නට බුදුසමය ටිබෙටයේ ස්ථාපිත නොවනු හෝ ප්‍රාදේශීය ජන ඇදහිල්ලක් වශයෙන් පවතිනු නොඅනුමාන ය. මේ හේතුවෙන් බුදුසමය ටිබෙටයේ ස්ථාපිත වීමට මෙන් ම රක්‍ෂණය හා පෝෂණය වීමට එරට රජවරුන්ගේ ප්‍රශංසාර්හ මැදිහත් වීම ටිබෙට් බෞද්ධ ඉතිහාසයේ සුවිශේෂී ගෞරවයකින් සනිටුවහන් වී තිබේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අබේසුන්දර. (1995). ටිබැට් බෞද්ධයෝ. නිවන්මඟ, 26 කලාපය, 31-32.

ආනන්ද හිමි, අම්පාරේ. (2008). ටිබැටයේ බෞද්ධ ඉතිහාසය. සාරදා, කුඹුරුගමුවේ වජිර නාහිමි උපහාර අංකය, 160-191.

ආනන්ද හිමි, වැල්ලවත්තේ, සහ කාන්ගහආරච්චි, ටී.බී. (1963). සංක්‍ෂිප්ත ලෝක බෞද්ධ සංස්කෘතිය. සමන් මුද්‍රණාලය. මහරගම.

ඉලංගසිංහ, මංගල. (2006). ආසියාවේ බෞද්ධ ඉතිහාසය. එස්. ගොඩගේ සහ සහෝදරයෝ. කොළඹ.

කමලසිරි හිමි, මිස්සක. (2007). අප්‍රකට බෞද්ධ ලෝකය. සමන්ති පොත් ප්‍රකාශකයෝ. ජා ඇල.

ධම්මදස්සි හිමි, නායිම්බල. (2009). ටිබෙට් බුදුසමය. කර්තෘ ප්‍රකාශන.

විමලඤාණ හිමි, මිරිස්වත්තේ. (2014). ටිබෙට් බෞද්ධ සාහිත්‍ය. ආසියාවේ බෞද්ධ සංස්කෘතිය (වරායායේ අතුල නායක ස්වාමීන්ද්‍ර අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය), 321-340.

සිරි සීවලී හිමි, බඹරැන්දේ. (1973). බෞද්ධ ලෝකය. ඇම්. ඩී. ගුණසේන සහ සමාගම. කොළඹ.

Bapat, P.V. (1971). 2500 YEARS OF Buddhism. Goverment of India: Ministry of Information and Broadcasting.